ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
--------------------------------

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම
-----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන<br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක 06 දරන මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, 2021 මාර්තු 17 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2020 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 18 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කළ අතර වාර්තාවල පැවති අඩුපාඩු කිහිපයක් නැවත නිවැරදි කිරීමට සිදු වූ බැවින් එම නිවැරදි කිරීම් සිදු කර 2021.03.17 නැවත ඉදිරිපත් කරන ලදී. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
-----------------------------

ආදායම් නොවන ලැබීම්
-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු අග්‍රිම ප්‍රමාණය රු. 247,001,944 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ලෙස රු.248,268,319ක් දක්වා තිබීමෙන් රු.1,266,375ක වෙනසක් නිරූපණය විය. | රු.1,266,375 ක වෙනස පසුගිය වර්ෂයේ නොපියවූ අත්තිකාරම් වන අතර එය මෙම වර්ෂය (2020) තුළදී පියවිය යුතු බැවින් මෙම අගය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ භාණ්ඩාගාර අග්‍රිම ගිණුමට එකතු කර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සකස් කර ඇති බව අවධානයට යොමු කරමි. | වර්ෂය තුළ ලැබීම් අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

-------------------------

දේපල පිරියත හා උපකරණ

------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් ගිණුමේ ශේෂය හා මූල්‍ය නොවන වත්කම් සංචිත ගිණුමේ ශේෂය අතර රු.277,700ක වෙනසක් විය. | මෙහි සඳහන් මූල්‍ය නොවන වත්කම් ගිණුමෙහි ශේෂය හා මූල්‍ය නොවන වත්කම් සංචිත ගිණුමේ ශේෂය අතර වෙනසට හේතුව නොපියවූ අත්තිකාරම් ලෙස පෙන්වන රු.277,700/-ක මුදල බව ඔබේ අවධානයට යොමු කරමි. | මූල්‍ය නොවන වත්කම් සංචිත ගිණුමට නොපියවූ අග්‍රිම ශේෂය ගැළපිය යුතු නොවේ. |

1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

----------------------------

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි අත්තිකාරම් අයකර ගැනීම් රු.383,323,827ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.381,737,747 වූයෙන් රු.1,586,080ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ශේෂයන් දැක්විය යුතු වේ. |
| (ආ) | දෙපාර්තමේන්තු ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි අත්තිකාරම් ගෙවීම් රු.265,424,450ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.264,333,657ක් වූයෙන් රු.1,090,795ක වෙනසක් විය. | ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී එය නිවැරදි කිරීමට බලාපොරොත්තු වෙමි. | -එම- |
| (ඇ) | SA – 52 ආකෘතියෙහි දැක්වෙන අත්තිකාරම් ලැබීම් ශේෂය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දැක්වෙන ශේෂය අතර රු.1,009,579ක වෙනසක් විය. | ඉදිරියේදී ගිණුම් සකස් කරන විට මෙය නිවැරදි කර ඉදිරිපත් කිරීමට බලාපෙරොත්තු වෙමි. | වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැළපීම් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) SA – 52 ආකෘතියෙහි දැක්වෙන අත්තිකාරම් ගෙවීම් ශේෂය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දැක්වෙන ශේෂය අතර රු.1,586,080 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී ඉදිරිපත් කරන විට මූල්‍ය කාර්ය සාධන ප්‍රකශය සකස් කරන විට මෙය නිවැරදි කර ගිණුම් ඉදිරිපත් කරන බවට අවධානයට යොමු කරමි. | -එම- |

1.6.5 අක්මුදල් ගැළපුම් ගිණුම
---------------------------
පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) SA – 52 ආකෘතිය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම් අතර වෙනස වූ රු.576,501 ක අක්මුදල් ගැළපුම් ගිණුමේ ගළපා නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අක් මුදල් ගැලපුම් ගිණුම නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ශේෂයන්ගේ වෙනස්කම් අක්මුදල් ගැළපුම් ගිණුමට ගැළපිය යුතු වේ. |
| (ආ) SA – 52 ආකෘති අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අත්තිකාරම් ගෙවීම් අතර වෙනස වූ රු.495,287 ක් අක්මුදල් ගැළපුම් ගිණුමෙහි ගළපා නොතිබුණි. | ඉදිරියේදී ගැලපුම් ගිණුම සකස් කිරීමේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |

1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම
-------------------------------------------
දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප ලේඛණය නඩත්තු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | 2020 වර්ෂයේ බැරකම් කිසිවක් උද්ගතව නොතිබූ බැවින් සටහන් කර නොමැති අතර මෙම වර්ෂයේ සිට බැරකම් උද්ගතවුව හොත් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

1.6.7 විගණන සාක්ෂි නොවීම
--------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ---------------------- | | ----------------------------- | ------------ |
| (අ) | රු.55,087,507 ක ණයගැතියන් සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | මෙම මුදල 2015 පෙර ගිණුම් අංශය හා වැඩ අංශය අතර ණයගැති ශේෂ සැසඳීමට අනුව කපා හැරීමට නියමිත ණයගැති ශේෂය වේ. එම ශේෂය රු. 85,284,890.01 කි. විගණන කළමනාකරණ කමිටු රැස්වීමෙන් රු.30,197,395.11 ශේෂයක් කපා හැරීමට අනුමැතිය ලබා දුන් බැවින් එම ශේෂය පොත් වලින් ඉවත් කරන ලදී. ඉවත් කිරීමෙන් පසු ඉතිරිවන ශේෂය රු.55,087,494.90 කි. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා සියලුම ණයගැතියන් සඳහා උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 ආදායම් කළමනාකරණය
---------------------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------------------------- | ------------ |
| 1995 සිට 2011 වර්ෂය දක්වා අයවීමට ඇති ණයගැති ශේෂය වූ රු.138,239,822 න් පසුගිය වර්ෂ 11 තුල කිසිඳු මුදලක් අයවී නොතිබුණි. | 1995 සිට 2007 දක්වා ණය ශේෂ අඩමාණ ණය ගිණුම මඟින් අදාල ගැලපුම් සිදු කිරීමට නිර්දේශයන් ලැබී ඇත. 2008 සිට 2015 දක්වා ණය සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කරමින් පවතී. 2015 සිට මේ දක්වා ණය සම්බන්ධයෙන් අදාල ආයතන වෙත ලිපි යොමු කරමින් පවතී. | අයවීමට ඇති ණයගැති ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

2.2 සීමාවන් කරා ළඟා නොවීම්

-----------------------------

රජයේ අත්තිකාරම් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් ළඟා නොවීම් පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය<br>--------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| ගබඩා අත්තිකාරම් හා කළවැඩ අත්තිකාරම් ගිණුම්හි ලැබීම්වල අනුමත අවම බැර සීමාව රු.120,000,000 හා රු.420,000,000ක් වුවද තත්‍ය සීමාව රු.56,087,363ක් හා රු.305,040,431ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තුවට එම සීමාවට ළඟාවීමට නොහැකි වී තිබුණි. | කොවිඩ් -19 පළමුවන සහ දෙවන රැල්ලෙහි ව්‍යාප්තිය හේතුවෙන් අප දෙපාර්තමේන්තුව මාස 05 කට ආසන්න කාලයක් වසා තිබිණි. එසේම සංචරණ සීමාව පැණවීමෙන් කම්කරුවන් හට වැඩබිම් වෙත යෑමට නොහැකි වූ තත්වය මත ව්‍යාපෘති සැලසුම් කල පරිදි නිම කල නොහැකි විය. එම නිසා ලැබීම් වල අනුමත අවම බැර සීමාව ළඟාකර ගැනීමට නොහැකි වී ඇත. | සීමාවන්ට අනුගතවීමට වගබලා ගත යුතු වීම. |

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

| විගණන නිරීක්ෂණය<br>--------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමට අදාළව වටිනාකම රු.1,141,584ක්වූ නිරවුල් නොවූ ණයහිමි ශේෂයක් පැවතුණි. මින් රු.324,021ක් වර්ෂ 02ත් 05ත් අතර ශේෂයන් විය. | ණය හිමියන් ලෙස ගිණුමේ දක්වා ඇති මුදල ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | බැරකම් නිසි පරිදි පියවීමට කටයුතු කළ යුතු වීම. |

2.4 කළවැඩ අත්තිකාරම් ගිණුම

-------------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| කළවැඩ අත්තිකාරම් ගිණුමේ 1995 සිට 2011 වර්ෂය දක්වා අයවීමට ඇති රු.138,239,822ක්වූ ණයගැති ශේෂයෙන් පසුගිය වර්ෂ 10 තුළ කිසිඳු මුදලක් අයවී නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | අයවීමට ඇති ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

2.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම
-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පළාත් සභා සඳහා මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 2කට වැඩි කාලයක සිට රු.466,400ක ශේෂයක් අය නොවී තිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | හිඟ ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) ලිපිගොනු අස්ථානගත වූ නිසා රු.32,630ක ණය ශේෂ අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර ඒ පිළිබඳව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 156 (6) අනුව සියලුම ලිපිලේඛන, පොත් පත්, වාර්තා සටහන්, ලේඛන යනාදිය විධි වූ පරිදි බැහැර කරනු ලබන තෙක් නිසි පිළිවෙලට හා මනා තත්වයෙන් සුරක්ෂිත භාරයේ තබා ගත යුතු වේ. |

2.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්
-----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර පරිපාලනය පිළිබඳව වූ ලිපිගොනු අංකනය, ඉදිරිපත් කිරීම, ස්ථාන මාරුවීම් වලදී ලිපිගොනු භාරදීම ආදී අභ්‍යන්තර පරිපාලන ක්‍රමවේද දැනට හඳුන්වා දී ඇත. ඒ සඳහා අදාල වෙනස්වීම් පිළිබඳව වූ සමාලෝචනයන් වසරෙන් වසර සිදුකරනු නොලබන අතර එය ඉදිරියේදී මහ හැරීමට කටයුතු කරනු ඇත. වැඩහල් වල කාර්යයන් සඳහාද විධිමත් ක්‍රමවේදයන් හඳුන්වා දී ඇති අතර ඒ පිළිබඳව සම්පිණ්ඩනයක් ඉදිරිපත් කර නොමැත. එය ඉදිරියේදී මඟහැරීමට කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.5 ඡේදය | විශ්‍රාම ගොස්/ මියගොස් වසර 04 ඉක්මවා තිබූ නිලධාරින් හත්දෙනෙකුගෙන් අයවිය යුතු රු.446,305 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | විශ්‍රාම යෑමෙන් හෝ මියගොස් වසර 4ක් ඉක්මවා ඇත. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 156(6) වන මුදල් රෙගුලාසිය | ගිණුම් පිලිබඳව වූ සියලුම ලිපිලේඛන, පොත් පත්, වාර්තා සටහන්, ලේඛන යනාදිය වගකිව යුතු නිලධාරියකු / නිලධාරීන් සුරක්ෂිතව භාරයේ තබා ගැනීමට කටයුතු නොකිරීම මත ණය ශේෂ අය කරගත නොහැකිව පැවතුණි. | අදාල ලිපිගොනු අස්ථානගතවීම සම්බන්ධයෙන් වගකිවයුතු නිළධාරීන් පිළිබඳ සොයාබලා කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතුව ඇති රු.382,400 ක ණය ශේෂය අදාළ ස්ථාන මාරු වී ගිය කාර්යාලයෙන් එක්වර අයකර ගත යුතු වුවද පළාත් පාලන ආයතන වෙත මාරු වී ගිය නිලධාරින්ගෙන් එම ණය ශේෂය වාරික වශයෙන් අයකරනු ලබන බව නිරීක්ෂණය විය. | පළාත් සභා ආයතන සඳහා මාරු වී ගිය නිලධාරීන් දෙදෙනාගෙන් ලැබීමට ඇති රු.382,400ක් වන ණය ශේෂයන් අයකර ගැනීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන ඇත. | ජාතික අයවැය චක්‍රලේඛය 118 අනුව කටයුතු කළ යුතු වීම. |

(ඈ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛය හා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | | | |
|---|---|---|---|
| 8.9.1 (ආ) ඡේදය | රුපියල් පන්ලක්ෂයක් ඉක්මවූ භාණ්ඩ කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත් එම විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමේ පෙන්වා දෙන පරිදි ඉතා නිවැරදි ලෙස සහ විධිමත් පරිදි අතපසුවීමකින් තොරව රුපියල් පන්ලක්ෂය ඉක්මවූ භාණ්ඩ හා කොන්ත්‍රාත් සඳහා විධිමත් ගිවිසුමක් යටතේ ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 අනුව කටයුතු කළ යුතු වීම. |

2.8 තැන්පත් ශේෂයන්
-------------------

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ දෙකකට වැඩි කාලයක් තුල නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂය රු.505,600ක් විය. | වර්ෂ දෙකකට වැඩි කාලයක් තුල නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂයයන් සඳහා අදාල ආයතන වෙත ලිපි යවා රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | වර්ෂ 02 කට වැඩි නිරවුල් නොවන තැන්පත් ශේෂයන් රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම. |
| (ආ) තාවකාලිකව රඳවාගත් තැන්පත් ගිණුමේ වර්ෂ දෙකකට වැඩි කාලයක් තුළ නිරවුල් නොවූ රු.508,570ක් විය. | අදාල ආයතන වෙත ලිපි යවා රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | නිරවුල් කළ හැකි තැන්පතු සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2020 මාර්තු 06 වන විට රු.22,199,572ක් ගෙවා තිබුණද ව්‍යාපෘතියෙහි කිසිඳු භෞතික ප්‍රගතියක් 2021 පෙබරවාරි 06 විගණිත දිනය දක්වාම සිදුවී නොතිබුණි. | මෙයට අදාල සිවිල් ඉංජිනේරුමය කාර්යයන් මේ වන විට ආරම්භ කර ඇත. යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන්ට අදාල සැලසුම් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් නිකුත් කිරීමට නියමිත අතර එම සැලසුම් නිකුත් වූ වහාම කාර්යයන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ නිමකිරීමට යෝජිත වූ ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 01 ක්වූ දෙපාර්තමේන්තුවේ අබලි යකඩ අංගනයෙහි II වන උපඅංගනය ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය සියයට 10 ක් පමණ විය. | අබලි අංගනයෙහි II වන උප අංගනය ඉදි කිරීමට අදාල සිවිල් ඉංජිනේරුමය කාර්යයන් මේ වන විට අවසන් කර ඇති අතර ඉතිරි වැඩ සඳහා අමුද්‍රව්‍ය මිලදී ගෙන ඇත. මෙම කාර්යය කඩිනමින් අවසන් කිරීමට සැලසුම් කර ඇත. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) කුඩාඔය ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයට ඇතුළුවන යකඩ පාලම සාදා සවිකිරීම සඳහා වූ ඇස්තමේන්තුව රුපියල් මිලියන 60ක්වූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙහි ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 10ක් විය. | අමුද්‍රව්‍ය අතුරින් සියයට 90 මේ වන විටත් මිලදී ගෙන ඇති අතර සැලසුම් හා නිර්මාණ නිම කර ඇත. පිරිවිතරවල යම් සංශෝධන සිදු කර නැවත මිල කැඳවීමට සිදු වූ අතර අදාල මිල වෙනස්කම් අනුව සංශෝධිත ඇස්තමේන්තුවට අනුමැතිය ලද වහාම එම අයිතමය ඇනවුම් කර කාර්යය ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඌන උපයෝජිත වත්කම් පහත සඳහන් ඉඩම් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය. | | |
| (i) කඩා ඉවත් කරන ලද පැරණි වැඩහල් අංක 07 පවතින භූමිය | මෙම භූමියෙහි වාහන සේවා කරන ස්ථානයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් යොමු කල අතර ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. ඉදිරියේදී මෙම ස්ථානයේ වාහන ගාල් කිරීම සඳහා අංගනයක් ඉදිකිරීමට නියමිතය. | වත්කම් හඳුනාගෙන උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) මෙන්දිස්වත්තේ සේවක නිවාස 03 පිහිටි ඉඩමේ අක්කර 01 රූඩ් 03 පර්චස් 11ක ඉතිරි භූමි ප්‍රදේශය | මෙම භූමි ප්‍රමාණය Turning Circle එක ඇතුලු මාර්ගය හා පැරණි නිවාස 3 වන අතර නිවෙස්හි පහසුකම් සැපයීමට යොදවා ගෙන ඇත. | -එම- |
| (iii) රූඩ් 01 පර්චස් 08.87ක ප්‍රමාණයක වූ බැරල් මඩුව | බැරල් මඩුවට අයත් ඉඩම මේ වන විට ආරක්ෂක අංශය සඳහා නවාතැන් ගැනීමට තාවකාලික මඩුවක් සකස් කර යොදවා ඇති අතර ඉදිරියේදී රජයේ කර්මාන්ත ශාලාව මඟින් සිදු කිරීමට යෝජිත දුම්රිය මැදිරි අලුත්වැඩියාවට අදාල වැඩපලක් මෙම අංගනයේ ඉදිකිරීමට සැලසුම් කරමින් පවතී. | -එම- |
| (iv) ප්‍රයෝජනයට නොගන්නා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ විෂයයන් තුනක් | Straight Machine - නිවැරදිව ස්ථානගත කර නොමැති නිසා හඳුනාගැනීම අපහසු වී ඇත. මෙම යන්ත්‍රය කාර්යයන් සඳහා විටින් විට යොදා ගනු ලැබේ. තවද Burner - මෙම උපකරණය නිවැරදිව හඳුනාගැනීම අපහසු වී ඇත. එසේම Power Hack Saw Machine - මෙම | -එම- |

| | | | |
|---|---|---|---|
| | | උපකරණය ද නිවැරදිව හඳුනාගැනීම අපහසු වී ඇත. මෙම පැරණි යන්ත්‍ර හා උපකරණ වෙන්දේසි කිරීමට කටයුතු යොදා ඇත. | -එම- |
| | (v) දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 06ක් පවරා නොදී ඌන උපයෝජිතව පැවතුණි. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 06 ක් පවරා නොදී තිබීමට හේතුව වන්නේ ඉල්ලුම්කල නිලධාරීන් නොමැති වීමයි. | |
| (ආ) | මායිම් තාප්ප හෝ ස්ථිර වැටක් යොදා දෙපාර්තමේන්තුව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයේ කර්මාන්තශාලා සේවක නිවාස පිහිටි ඉඩමේ ඉතිරි අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 11ක භූමි භාගය අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි. | මෙම ඉඩෙමන් අක්කර 07 යි රූඩ් 01 යි පර්චස් 38ක ප්‍රමාණය 2011 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරියට පවරා දීම සිදු කරන විටත් ඉතිරි ප්‍රමාණය අනවසර පදිංචිකරුවන් විසින් අල්ලාගෙන තිබී ඇත. මේ සම්බන්ධෙයන් අවශ්‍ය නීතිමය කටයුතු කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියට මේ වන විටත් දන්වා ඇත. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | දෙපාර්තමේන්තුව සතු පහත සඳහන් ඉඩම් 03 ක් වෙනුවෙන් ඔප්පු දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර මිනින්දෝරු සැලැස්ම පදනම්කරගෙන ප්‍රාදේශීය ලේකම් මගින් අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම කාර්යය සඳහා මිනින්දෝරු සැලැස්ම ඇඳීම මිනින්දෝරු දෙපාර්තමේන්තුවට පවරා ඇති අතර තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට පවරා ඇත. | අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | දෙපාර්තමේන්තුවට අයත් රජයේ නිල නිවාස 14ක් ඒවා ලබාගත් නිලධාරීන් විසින් බාහිර පාර්ශවයන් වෙත කුළී පදනම මත පවරා දී තිබුණි. | නිලධාරීන් විසින් බාහිර පාර්ශවයක් වෙත නීත්‍යානුකූල නොවන ආකාරයෙන් කුලී පදනම මත පවරා දී තිබූ නිවාස දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | රුපියල් 2,382,546ක් වටිනා තහඩු, ලෝහ ද්‍රව්‍ය හා ආනයනික උපාංග කිසිඳු භාවිතයකින් තොරව හා නිෂ්පාදන කාර්යයට නොගෙන පරිශ්‍රයේ රඳවා තබා ගෙන ඇති බව නිරීක්ෂණය විය. | මෙම උපාංග වෙළඳපල සුලබව පවතින උපාංග නොවන අතර බොහෝමයක් ආනයනය කිරීමට සිදුවන උපාංග වේ. වාරි ව්‍යාපෘතිවල හදිසි අලුත්වැඩියා සඳහා මේ අතුරින් බෝහෝමයක් උපාංග භාවිතා වන අතර එම අවස්ථා වලදී කඩිනමින් අලුත්වැඩියා කල යුතු බැවින් එම උපාංග ප්‍රධාන ගබඩාව භාරයේ ගබඩා කර ඇත. | අමුද්‍රව්‍ය උපාංග උපරිමයෙන් ප්‍රයෝජනයට ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | දෙපාර්තමේන්තුව සතු වාහන 06ක් සමාලෝචිත වර්ෂය තුළදී ධාවනයෙහි යෙදී නොතිබුණු නමුත් ඒ වෙනුවෙන් වර්ෂය තුළදී රු.105,717ක වියදම් දරා තිබුණි. | දෙපාර්තමේන්තුව සතු වාහන කිහිපයක් විශාල අලුත්වැඩියා කිහිපයක් සිදු කළ යුතුව පවතින අතර එම වාහන කඩිනමින් අලුත්වැඩියාව සඳහා පියවර ගනිමින් පවතී. | -එම- |

4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 770ක්වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 412ක් විය. ඒ අනුව 358ක්වූ පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා අමාත්‍යාංශය වෙත ඉල්ලුම්කර ඇති අතර එම පුරප්පාඩු එම අමාත්‍යාංශයේ PACIS පද්ධතියට මාසිකව මාර්ගගතව යාවත්කාලීන කරනු ලබයි. | දෙපාර්තමේන්තුව විසින් අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |